# එක්සත් රාජධානියේ සිට ශ්‍රී ලංකාවට යොමුවුණු සානුකම්පික මෙහෙවර

# UK Mercy Mission to Sri Lanka



Doctors talk to the girl-patient after the surgery. Mother looks on.

## ශ්‍රී ලංකාවට ගොස් හෘද රෝගී දරුවන් නොමිළේ සුවපත් කරන විශේෂඥ වෛද්‍ය කණ්ඩායම



**Mr Jai Lameer**
**The trustee & coordinator of the Mercy Mission**

ලන්ඩනයේ සුප්‍රකට ළමා රෝහලක්වන ගයිස් තොම්සන් රෝහලේ සේවයේ නියුතු විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් හා හෙදි සොහොයුරියන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් වසරකට වරක් ශ්‍රී ලංකාවට ගොස් එහි හෘදරෝගී ළමයින් සොයා ඔවුන් ශල්‍යකර්ම මගින් සුවමත් කිරීමේ මහඟු කටයුත්තක දැන් වසර ගණනාවක සිට යෙදී සිටිති. මෙම සේවය සිදුකරන්නේ නොමිලයේ ය. මේ සඳහා උපකාරීවන සත්කාරක රෝහල ගාල්ලේ කරාපිටියේ මහ රෝහලයි. මෙම කාර්‍යයට ඔවුන් නම් තබා ඇත්තේ සානුකම්පික මෙහෙවර හෙවත් ඉංග්‍රීසි බසින් මර්සි මිෂන් යන්නයි.

මෙම මහඟු කර්තව්‍යයට මුල්වුණේ ලන්ඩනයේ පදිංචිව සිටින එක් ගුණවත් ශ්‍රීලාංකිකයෙකුගේ මැදිහත්වීමෙනි. ඔහු කොළඹ වෙස්ලි විදුහලේ ආදි ශිෂ්‍යයෙකු වන ජායි ලමීර් මහතාය.

මීට තුඩුදුන් කතා පුවත මෙසේය. ජායි 2000 වසරේ නත්තල් සමයේ දී බයිපාස් හදවත් සැත්කමකට ලන්ඩනයේදි භාජනය විය. ඔහුට සැත්කම කළ ශල්‍ය වෛද්‍යවරයා කෝනල් ඔස්ටින් මහතාය. සැත්කමෙන් පසු ජායි සහ වෛද්‍යවරයා වඩාත් මිත්‍රවූහ. තොරතුරු අසද්දී ජායි ලංකාවේ බව ඇසූ දොස්තර ඔස්ටින් තමා ලංකාවට ගොස් එහි හෘදරෝගී දරුවන් සුවපත් කරන්නට කැමති බව කීය. ජායි ඉතා උනන්දුවෙන් ඊට මග පාදා ගත්තේය. ජායි ලමීර් මහතාත් වෛද්‍ය ඔස්ටින් මහතාත්, සිම්ප්සන් නම් වෛද්‍ය වරයාත් එක්ව ඊට මුදල් ආධාර සොයන පුණ්‍යායතනයක් පිහිටවූහ. එහි නම මර්සි මිෂන් වූ ශ්‍රීලංකාය

මෙම විශේෂඥ වෛද්‍ය කණ්ඩායම දැන් හත්වරක් ලංකාවට ගොස් ඇත. ළමයින් සියයකට වඩා සැත්කම්කර ඔවුන් මරණයෙන් බේරාගෙන ඇත. බොහෝ දුර බැහැර සිටද දෙමාපියෝ කුඩා දරුවන් කරාපිටිය රෝහලට රැගෙන එති. මෙය ශ්‍රීලංකා රජයේද අතිශය පැසසුමට ලක්ව ඇත.

මෙම සානුකපික මෙහෙවර ඉදිරියටත් කරගෙන යාමට මුදල් අවශ්‍යය. අපේ රටේ යහපත සඳහා ආධාර කරන්නට මෙය ඉතා යෝග්‍ය පුණ්‍ය කටයුත්තකි. ලමීර් මහතා මුලදී මෙය පටන්ගත්තේ තමාගේම මුදල් වියදම් කිරීමෙනි. මෙයට උදව්කිරීම මව්බිමට ලැදි සියළු දේශප්‍රේමීන්ගේ යුතුකම විය යුතුය. වැඩි විස්තර සඳහා මේ පහත සඳහන් කර ඇති වෙබ් අඩවිය බලන්න.

**www.mercymission.co.uk**



Dr John Simpson, Surgeon Mr Conal Austin FRCS and Dr Namal Gamage - the host surgeon of Galle Karapitiya Hospital.

Guy's (Paediatric Cardiac) Surgery Mercy Mission is a British registered Charity (1111275) formed in 2001, it is solely funded by donations and sponsorship and has emerged as the leading British based Sri Lankan Charity in the UK. There are three trustees - Mr Conal Austin FRCS, Dr John Sympson and Mr Jai Lameer.

The Mercy Mission team comprises of 12 highly proficient personnel from the top echelons of the British Medical fraternity. The team was originally from the world renowned Guy's Hospital in London Bridge. The team is led by Mr Conal Austin FRCS, Dr John Sympson FRCP, Dr Craig Bailey, Dr Laine Jonston, Dr Paul James and a team of well-qualified nurses led by Sister Jane Stenhouse.

The Mercy Mission began as a cameraderie which had sprung up between Srilankan Jai Lameer and his Doctor in the UK, Conal Austin after he performed a by-pass operation on Jai. The desire to carry out operations on Children in Sri Lanka voiced by Dr Austin blossomed into the Mercy Mission which has operated on 86 children and seen over a thousand since 2002. The mission, which initially started off in Colombo, is now conducted in the Karapitiya Hospital in Galle.

Out of 10 missions promised by Dr Austin to Mr Lameer, the 7th one had been completed in October last year. They would like to do more trips to Sri Lanka and heal more children with heart problems.

" Children who have had operations visit us the following year when we get there. That's very encouraging. We like seeing them better; some of them are completely transformed " smiles Dr Simpson

The objectives of the trustees of the Mercy Mission are to raise enough funds to fulfil the task they have undertaken. They expect help from donors, friends and well-wishers.

**For more information please visit the Website.**

**www.mercymission.co.uk**



අබේවර්ධන සිය ආදරණීය බිරිඳ නිරංජලා සමග

# සොඳුරු ගායකයා අප හැර ගියේය

සිංහළ අවුරුද්දට දින කීපයකට කලින් අප සවනට හදවතට ගී මිහිර බෙදූ කෝකිල හඬ නිහඬ වී යයි කිසිවෙක් පුවත්පතක ලියා තිබුණේය. ඒ අබේවර්ධන බාලසූරිය නම් සුවහසක් ශ්‍රී ලාංකික ශ්‍රාවක ජනතාවක් මධුර ස්වරයෙන් පිනවූ කලාකරුවාණන්ගේ අකල් වියෝගය පිළිබඳවය. හොඳ සෞඛ්‍ය තත්වයක පසුවූ අබේ හදිසියේ රෝගාතුර වූ බව ඇසූ මුළු මහත් ලංකාවම කම්පාවිය. සුවපත්වේවායි කවුරුත් ප්‍රාර්ථනා කළහ. එහෙත් ඔහු යළි නොපැමිණ යන්නටම ගියේය. අබේගේ ගැයුම් අගයන විදේශගත ලාංකිකයෝ බොහෝ දෙනෙක්ද අතිශයින් දුක්වෙති.

කුලරත්න ආරියවංශ ලියූ ආදරයෙන් මා හද වට එතෙන ලතා නම් ගීතයෙන් අබේ මුල් වරට රසිකයින් අතර ජනප්‍රිය වූ සැටි අපට මතකය. ඒ සමග ඔහු අප රටේ ජනප්‍රිය ගායකයින් අතරට එක් වුණේය. ඉන් ඉක්බිති ඔහු ත්‍යාගා එන් එඩ්වඩ් සමග රැ පැල් රකින කුරහන් පැහෙනා හේනේ නම් ගීතය ගයා ඉමහත් ශ්‍රාවක ආදරයක් ප්‍රතිචාරයක් ලැබුවේ ය. අජන්තා රණසිංහ පදරචනා කළ, සරත් දසනායක තනු සංගීත නිර්මාණය කළ එම ගීතය අව්‍යාජ ගැමි සුන්දරත්වය හා සෙනෙහස ඉතා කදිමට නිරූපණය කරන්නකි.

අබේ යන ආදරබර නාමයෙන් සහෝදර කලාකරුවන් අතර ප්‍රචලිතව සිටි ඔහුගේ ගම හලාවත, මුගුණවටවන ය. ඉපදුණේ 1945 මාර්තු මස 9 වෙනි දාය. මුල් යුගයේ ලංකා වී අළෙවි මණ්ඩලයේ ලිපිකරුවෙකු ලෙස සේවය කළ අබේ ශ්‍රී ලංකාව ටෙලිවිෂන් සේවය ඇරඹූ කල්හි රූපවාහිනී සේවය සහ සම්බන්ධ වීය. ඔහු නිශ්පාදනය කළ **නන්දන වින්දන** හා **අඳුන** වැනි වැඩ සටහන් එකල ප්‍රේක්ෂක ජනතාව අතර අතිශයින් ජනප්‍රිය වූ බව අපට මතකය. විද්‍යුත් මාධ්‍ය කලාවට ඔහුගෙන් වූ දායකත්වය ඉමහත්ය.

අබේ දුහුල් මලක් චිත්‍රපටයට සුජාතා අත්තනායක සමග ගැයූ **බොඳ මීදුම් කඳු රැල්ලේ** නම් ගීතය එදා මෙන්ම අද ද එකසේ ජනප්‍රියය. සිය භාවමය හඬින් ප්‍රේමය, විරහව ඉස්මතුකරන්නට සමත් ඔහු දේශානුරාගී ගීත ගැයුමටද ආශාවක් දැක්වූයේය. අනුරාධපුරය ඔබයි, මං නැතිදා මේ රට ඔබටයි, අවසන් හුස්ම පොද, වැනි ගීත එයට නිදසුන් වෙති.

අබේගේ වියෝගයෙන් ඔහුගේ ආදරණීය බිරිඳ නිරංජලා ශෝකයෙන් මුසපත්ව සිටී. සුවයෙන් සිටින විට මෙන්ම අසනීප වූ පසුද ඇය ඔහු ළඟින් නොසෙල්වී උවටැන් කළාය. ඔව්හු හැම විටම ආදරණීය යුවලක් වූහ.

අබේවර්ධන බාලසූරිය වැනි ප්‍රතිභා සම්පන්න කලාකරුවෙකුගේ වියෝගය රටකට එහි සෞන්දර්‍ය ක්ෂේත්‍රයට ඉමහත් එමෙන්ම කිසිදා පිරවිය නොහැකි අඩුවකි, පාඩුවකි.

කලාකරුවෙකු වියෝවුවත් ඔහුගේ නිර්මාණ ඔහු සිටි සමාජය පෝෂණය කරන්නේය. එය සැබවකි අබේගේ කටහඬ අපට ඇසෙහි. ඔහු තවම අප හා සිටියි.

**වෙනුර**

## හිතාදර අබේ

රැපැල් රකින කුරහන් පැහෙනා හේනේ
මගෙ තනි නොතනියට නුඹවත් නැතුවානේ
ඔබේ හඬ ඇසෙන හැම මොහොතක් ගානේ
සිදුවූ දේ ඔබට කෙලෙසද වාවන්නේ

හැත්තෑ දශක මා දුටු සුන්දර කාලේ
ඒ දශකයයි මිනිමුතු මතුවුණු කාලේ
එදා මෙදා තුර ශ්‍රාවක සිත් බැඳුණේ
ඔබගෙද මිහිරි හඬ හන්දයි අප දන්නේ

නොමවිය ලෙහෙසි අද දින මෙන් ඒ යුගයේ
පිරිපුන් කුසලතා ඇත්තන් වැඩි වැඩියේ
දස්කම් දක්වද්දි ඔබ එහි පිවිසුනියේ
ගායන ලොවේ ඉහළම මට්ටම ලදුයේ

නන්දන වින්දනය කර සිත වින්දනය
ලද පුද සම්මාන අප රූ වාහිනිය
ලබැඳි අබේ අප ඔබ බැඳුනා වැඩිය
මෙතරම් දුකක් කඳුලක් ඒ හින්දාය

ඉරහඳ යට හමුවී සෙනෙහස වැඩුවා
ගිය විට මව්බිමට අප සොයුරන් වූවා
සමුගද්දී යළි හමුවන දින ඇසුවා
යළි කෙලෙසක හමුවේදැයි නොදනිම්මා

♦ **අමර ගුණසේකර** France